# ලංකා බැංකු සේවක සංගමය
# இலங்கை வங்கி ஊழியர் சங்கம்
# CEYLON BANK EMPLOYEES' UNION

ලියාපදිංචි අංකය
பதிவு இல : 1151
**Registered No**

අංක 20, පන්සල පාර, කොළඹ 10. இல. 20, பன்சல வீதி, கொழும்பு 10, No. 20, Temple Road, Colombo 10
දුරකථන /தொலைபேசி/ Telephone:011-2693811/011-2674840, ෆැක්ස් /தொலைநகல்/ Fax: 011-2674840
E.Mail : cbeu@sltnet.lk, cbeu1@sltnet.lk, Web - www.cbeu.lk


(අභ්‍යන්තර විවරණිකාව - සාමාජිකයින් අතරේ පමණයි)

ප්‍රිය සහෝදරය/සහෝදරිය

පී.යු.2019/37

## ලංකා බැංකු සේවක සංගමය විසින්

# රටේ ආර්ථිකය, බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ඉදිරි දැක්ම

## ප්‍රධාන දේශපාලන පක්ෂ නායකයින් සහ ජනාධිපති අපේක්ෂකයින් වෙත යොමු කෙරේ

බැංකු ක්ෂේත්‍රය නියෝජනය කරන ප්‍රධානතම වෘත්තීය සංගමය ලෙස අප සංගමය පසුගිය 75 වසරක් පුරා රටේ ජාතික ප්‍රශ්න මෙන්ම බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ ප්‍රශ්නවලදී ද අවශ්‍ය නිසි මැදිහත්වීම් කරමින් කටයුතුකර ඇත. පසුගිය දශක ගණනාවක් මුළුල්ලේ නිශ්චිත ජාතික ප්‍රතිපත්තියකින් තොරව ගෙනයන ලද පාලන ක්‍රමයන්හි ප්‍රතිවිපාකයන් ලෙස අප රටේ සෑම ක්ෂේත්‍රයක්ම බරපතල අර්බුද ගණනාවකට මුහුණ දෙමින් සිටී. වත්මන් කාලසීමාව තුළ පැන නැගි දේශපාලන අර්බුද හේතුවෙන් එය දවසින් දවස වඩාත් උග්‍ර වෙමින් පවතී.

එබැවින් එම තත්වය යම්තාක් දුරකට සමනය කරමින් ජනතාවට මෙන්ම රටේ ආර්ථිකයට ද ප්‍රයෝජනවත් විය හැකි යෝජනා මාලාවක් සංගමය විසින් ප්‍රධාන දේශපාලන පක්ෂ නායකයින් හා ජනාධිපති අපේක්ෂකයින් වෙත යොමුකරන ලදී. එම යෝජනා මාලාව ඉදිරි රාජ්‍ය පාලනය තුළින් ඉදිරියට ගෙනයාම සඳහා සහ ඉදිරියේ දී දේශපාලන පක්ෂ විසින් එළි දක්වනු ලබන මහ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයන්ට ද ඇතුළත් කිරීම සඳහා යොමු කිරීමට ද අදහස් කර ඇත.

රාජ්‍ය හා පෞද්ගලික බැංකු 19 ක 30,000 ක ශ්‍රම බලකායක් නියෝජනය කරන ස්වාධීන වෘත්තීය සංගමයක් ලෙස අපි මෙම ප්‍රතිපත්ති මාලාව තවදුරටත් සංවර්ධනය කරමින් සමාජගත කිරීමට අපේක්ෂා කරන අතර එහිදී ජනතා කැමැත්ත අපේක්ෂා කරන සියලු දේශපාලන පක්ෂ ඒ කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වනු ඇතැයි අපේක්ෂා කරමු. අපගේ අවසාන අරමුණ වැඩ කරන කම්කරු පන්තියේ නියෝජිතයින් ලෙස රටටත්, ජනතාවටත්, කම්කරු පන්තියටත් හිතැති අනාගත රාජ්‍ය පාලනයක් බිහිවනු දැකීම බව අවධාරණයකර සිටිමු.

වඩාත් ජනතාවාදී බැංකුකරණයක් සඳහා බැංකු ක්ෂේත්‍රයට අදාළ යෝජනා සහ පොදුවේ රටේ අනාගතයට බලපාන පොදු යෝජනා ලෙස එම යෝජනාවලිය ප්‍රධාන කොටස් 2 කට බෙදා දක්වා ඇත

## බැංකු ක්ෂේත්‍රයට අදාළ යෝජනා

01 ජාතික වගකීම තවදුරටත් ශක්තිමත් කිරීමට **රාජ්‍ය බැංකු කිසිදු ආකාරයකින් පෞද්ගලීකකරණය නොකරන බවට සහතිකයක් ලබාදෙන ලෙසින් යෝජනා කර සිටිමු.**

02 ***රාජ්‍ය බැංකුවල ප්‍රාග්ධනය සපුරා ගැනීමේ දී කිසිදු ආකාරයක කොටස් නිකුත් කිරීමක් හෝ පෞද්ගලීකකරණ තීන්දුවක් නොගතයුතු බවට යෝජනාකර සිටිමු.***

එසේම බැංකු පද්ධතියේ ආරක්ෂණය උදෙසා පනවනු ලබන ජාත්‍යන්තර නියාමනයන් (Basel Requirments) ***දේශීය බැංකු පද්ධතියට ගැළපෙන අයුරින් සංශෝධනය කළ යුතු බවටත් යෝජනා කරමු.***

03 රාජ්‍ය බැංකුවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීම සඳහා ආචාර ධර්ම පද්ධතියක් සහිත නියාමන අධිකාරියක් පත් කරන ලෙසටත්, එම අධිකාරියෙහි ස්වාධීනත්වය තහවුරු කරන ලෙසටත් යෝජනා කරමු.

04 **සියලු රාජ්‍ය බැංකුවල විශ්‍රාම හිමිකම ස්ථාපිත කිරීම**

රාජ්‍ය බැංකුවල විශ්‍රාම වැටුප් හිමිකම 1996 දී අහිමි කරන ලදුව 2014 වසරේ දී නැවත වරක් ස්ථාපනය කරන ලදී. එහෙත් එම විශ්‍රාම ක්‍රමවේදය අනුව සේවකයාට හිමිවන්නේ ජීවත්වීමට ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක් නොවේ.

රාජ්‍ය බැංකුවල පැරණි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා නව විශ්‍රාම යෝජනා ක්‍රමය යනුවෙන් ක්‍රමවේදයන් 02 ක් පවතින අතර එය එකම බැංකුවක සේවකයින්ට දෙආකාරයකට සැළකීමකි. (Discrimination) එබැවින් රාජ්‍ය බැංකු තුළ ක්‍රියාත්මක පැරණි විශ්‍රාම ක්‍රමවේදයම 1996 න් පසුව සේවයට බැඳුණු සේවකයන් වෙනුවෙන් ද ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු බවට යෝජනාකර සිටිමු. තවද විශ්‍රාම ප්‍රතිලාභ අහිමි අනෙකුත් රාජ්‍ය බැංකුවල සේවකයින් හට ද එවැනිම විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.

එමෙන්ම පෞද්ගලික බැංකුවල සේවකයින් හට ද විශ්‍රාම දිවිය සුරක්ෂිතවන පරිදි පවතින විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රම සැකසීමට ද, අවසාන වශයෙන් සියලු බැංකුවල විශ්‍රාම ලබා යන සමස්ත සේවක ප්‍රජාව හට සිය දිවියේ සැ ඳෑසමය සහනදායීව ගත කළ හැකි ප්‍රමාණවත් හා සාධාරණ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ක්‍රමවේදයන් එම බැංකු තුළ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු බවට යෝජනාකර සිටිමු.

05 ***දිවයින පුරා විසිරී සිටින සුදුසුකම් සපුරා ඇති ඕනෑම පුරවැසියෙකුට රාජ්‍ය බැංකු සේවයට ඇතුලත් වීමට ඇති අයිතිය සුරැකිය යුතු බවට යෝජනා කරමු.***

රාජ්‍ය බැංකු සඳහා නවක සේවකයින් බඳවා ගැනීමේදී පිළිගත හැකි සහ සම්මත ක්‍රමවේදයක් යටතේ එය සිදුකළ යුතුය. එම බැංකුවල පුරප්පාඩු ඇති වන්නේ නම් සහ ඒ සඳහා බඳවා ගැනීම් සිදුකළ යුත්තේ නම් පුරප්පාඩු සංඛ්‍යාව, සුදුසුකම් හා වයස් සීමාවන් ආදිය ගැසට් කළ යුතුවේ. ඊට අමතරව පොදු සන්නිවේදන මාර්ග මගින් ප්‍රසිද්ධ කළ යුතු අතර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හෝ එවැනි පිළිගත් රාජ්‍ය ආයතනයක් මගින් පවත්වනු ලබන තරඟ විභාගයකට සියලුම අයැදුම් කරුවන් පෙනී සිටිය යුතු වේ. විභාග සමත්වන, සුදුසුකම් සපුරන අපේක්ෂකයින් නිසි පරිදි පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් සමත් වන්නේ නම් බඳවා ගැනීම් කළ යුතු අතර ඒ සඳහා කිසිදු ආකාරයක දේශපාලන හෝ වෙනත් කිසිදු අයථා බලපෑම් එල්ල නොකල යුතු බවට යෝජනාකර සිටිමු.

06 බැංකු මගින් ණය ලබාදීමේදී තැන්පතු පොලිය සහ ණය පොලිය අතර ප්‍රශස්ථ සීමාවක් නියාමන ආයතන විසින් පැනවීම සහ එම සීමාව වාණිජ බැංකු සඳහා පොදු සීමාවක්ද විශේෂ බලපත්‍රලාභී බැංකු සඳහා පොදු සීමාවක්ද ලෙස නියාමනය කළ යුතු බවට යෝජනා කර සිටිමු.

07 බැංකුකරණයේදී ගනුදෙනුකරුවන්ගෙන් අයකරගන්නා සියලු ගාස්තු සමාන තත්වයකට පත්කළ යුතු බවට යෝජනා කර සිටිමු.

08 බැංකු විසින් ලබාදෙනු ලබන ණය මුදල්වල ''ණය ලබාගන්නා හේතුව'' සඳහන් කිරීම මහ බැංකුව විසින් නිසි සුපරීක්ෂණයට ලක්කළ යුතුය. සහන පොලී ණය යෝජනා ක්‍රමයන් අවභාවිතය වළක්වනු පිණිසත්, එම ණය සඳහා පොලී සහනයන් ලබාදී ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරන ක්ෂේත්‍ර සඳහා මූල්‍ය සවිබලගැන්වීම නිසිපරිදි සිදුකරනු පිණිසත් මෙම සුපරීක්ෂණ ක්‍රියාවලිය වඩාත් විධිමත් කළයුතු බවට යෝජනා කර සිටිමු.

09 බැංකුවල පවතින අලෙවිකරණය සඳහා මුදල් වෙන් කිරීම (Budget for Marketing) ඉහත සඳහන් තරඟකාරීත්වය හේතුවෙන් ඉතාමත් ඉහළ අගයක් ගෙන ඇත. රටේ ආර්ථිකය දියුණු කිරීම සඳහා බැංකුකරණයට දායක නොවී බැංකු තුළ පවතින මුදල්ම එකිනෙක බැංකු අතර හුවමාරුවීම බැංකු පිහිටුවීමේ මූලික අභිලාෂය විනාශවීමකි. ඒ අනුව බැංකු අතර අනවශ්‍ය තරඟකාරීත්වය උග්‍රකරන, අලෙවිකරණය සඳහා මුදල් වෙන්කිරීම දැඩිව විගණනය කිරීමටත්, බැංකු නියාමකයින්ගේ දැඩි සුපරීක්ෂණයට නතු කිරීමටත් ඒ තුළින් ඉතිරිවන මුදල ගනුදෙනුකරුවන්හට පොලී සහනයක් ලෙස ලබාදීමටත් යෝජනා කර සිටිමු.

10 ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාදීමේදී බැංකුවේ උපරිම පොලී සීමා පැනවීමටත් වාර්ෂික සඵල පොලී අනුපාත සීමා පැනවීමටත් ණය ලබාදීමේ හේතුව නිවැරදිව දැක්වීමටත් අවශ්‍ය විධිමත් සුපරීක්ෂණයන් සිදුකරන ලෙස යෝජනා කර සිටිමු.

11 බැංකු නොවන මූල්‍ය ආයතනවල හැසිරීම පිළිබඳව විධිමත් නියාමනයක් ඇති කිරීම හා ව්‍යාපාර කටයුතු සාධාරණව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වාණිජ බැංකුවලට පනවා ඇති සීමාවන් බැංකු නොවන අනෙකුත් මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ද බලාත්මක වියයුතු බවට යෝජනා කර සිටිමු.

12 බැංකු හා මූල්‍ය ආයතන ඇතුලත සිදුවන අක්‍රමිකතා නිරීක්ෂණය කිරීම සඳහා කඩිනමින් මැදිහත් විය හැකි යාන්ත්‍රනයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ පිහිටුවන ලෙසට යෝජනාකර සිටිමු.

13 අතීතයේ දී රාජ්‍ය බැංකු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වෙත ලබාදී තිබූ සහනදායී වාහන ආනයන බලපත්‍ර හිමිකම පසු අවස්ථාවල දී රාජ්‍ය බැංකු සේවකයන් හට අහිමි කරන ලදී. එම පහසුකම යළි ලබාදිය යුතු බවට යෝජනාකර සිටිමු.

14 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත මගින් උපයන විට ගෙවීම් බදු අයකරන ආදායම් සීමාව රු. 100,000/= දක්වා ඉහළ නංවන අතරම බදු අයවන මාසික ආදායම ගණනය කිරීමේ දී සිදුකරන ලද පහත සඳහන් සංශෝධනයන් නිසා සේවකයින් බරපතල අසාධාරණයකට ලක්ව සිටිති.

i ආයතන මගින් ලබාදී ඇති සියලු සේවක ණයවල සහන පොලී අනුපාතය හා වෙළඳපොළ පොලී අනුපාතය අතර වෙනස
ii නොමිලේ ලබාදෙන ආහාර හෝ ඒ වෙනුවෙන් ලබාදෙන දීමනා
iii පොදුවේ ගෙවනු නොලබන වෛද්‍යාධාර දීමනා
iv ආයතනය විසින් සපයනු ලබන විදුලි බිල්/ජල බිල්/රක්ෂණ වාරික/වෘත්තීය ආයතන සාමාජික ණය/රාජකාරී නොවන ගුවන් ගමන් ටිකට්පත් වැනි ප්‍රතිලාභ

සේවකයාගේ බදු අයවන ආදායම ලෙස සැලකීම.

සේවකයින්ගේ ආදායම වෙත බරපතල ලෙස බලපෑම් ඇති කරන ඉහත සඳහන් සංශෝධනයන් ඉවත් කර සේවකයින් වෙත සහන ලබාදෙන ලෙස යෝජනා කර සිටිමු.

## පොදු යෝජනා

01 ***ණය උගුලෙන් ගැලවීමට යැයි කියමින් රාජ්‍ය බැංකු ඇතුළු ජනතාවට අත්‍යවශ්‍ය සේවාවන් සපයන රාජ්‍ය ආයතන විකිණීම නොකළ යුතු බවට යෝජනාකර සිටිමු.***

අපගේ රට කෘෂිකාර්මික රටක් වුව ද වර්තමානය වනවිට සහල් ඇතුළු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම කණගාටුදායක තත්වයකි. ඒ අනුව ඉතා ඉක්මණින් කෘෂිකාර්මික විප්ලවයක් සඳහා රට යොමුකර විය යුතුය. එමෙන්ම කර්මාන්ත අංශයන් ද වර්ධනය කරමින් විදේශයන්ට ගලා යන මුදල් අවම කළ යුතු වේ. සේවා අංශය ද මනා කළමනාකරණයක් යටතේ තවදුරටත් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. එමගින් ආනයන අවම කර අපනයන ඉහළ නංවා ගැනීම කළ යුතුය.

අප රටේ රාජ්‍ය අංශය සතු ආයතන විශාල සංඛ්‍යාවක් ඇති අතර අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි අංශ වෙනුවෙන් පිහිටුවා ඇති ආයතනවලින් ආදායම් අපේක්ෂා කළ නොහැක. එහෙත් තම නිෂ්පාදන සඳහා මිලක් නියම කරන ජලය, විදුලිය, ඛණිජ තෙල්, වරාය වැනි රාජ්‍ය ආයතන නිසි කළමනාකරණයක් යටතේ වර්ධනීය තත්වයන්ට පත් කළ යුතුය. එම රාජ්‍ය ව්‍යවසායන්ගෙන් ලාභය පමණක් අපේක්ෂා කිරීම යුක්ති සහගත නොවන නමුත් වාර්ෂිකව භාණ්ඩාගාරයෙන් ඒවා නඩත්තුව සඳහා යොදවන අතිවිශාල මුදල අවම කිරීම සඳහා දේශපාලන බලපෑම්වලින් තොර නිසි කළමනාකරණයකට ලක්කළ යුතුය.

02 **දූෂණය පිටුදැකීම වෙනුවෙන් ස්වාධීන කොමිෂන් සභාවල ක්‍රියාකාරීත්වය සවිබල ගැන්වීමට යෝජනාකර සිටිමු.**

අල්ලස, දූෂණය, මහජන මුදල් අවභාවිතය, රාජ්‍ය දේපල අපහරණය හේතුවෙන් රාජ්‍ය ආයතන මෙන්ම රාජ්‍ය ව්‍යවසායන්ද බරපතල අර්බුදයන් වලට පත්වීම පසුගිය දශක ගණනාවක් පුරාම නිරීක්ෂණය කළ හැකිවිය. එම දූෂණ ක්‍රියා නිසා අකර්මන්‍ය වන රාජ්‍ය ව්‍යවසායයන් විකුණා දමන්නේ එම අකාර්යක්ෂමතාවය හේතු ලෙස දක්වමින්ය. තවද, දූෂිත ක්‍රියා හේතුවෙන් රාජ්‍ය සේවාවන් කප්පාදු කිරීමෙන්ද, රජයක් ලෙස ජනතාවගේ සුභ සාධන ඇතුලු අනෙකුත් වරප්‍රසාදයන් දිනෙන් දින අහිමි කෙරෙමින් ඇත.

එමෙන්ම රටේ ආර්ථිකය වර්ධනය කිරීමට ප්‍රධාන බාධාවක් වී ඇති නාස්තිය, දූෂණය, අල්ලස් හා වංචාවන් පිටුදැකීම අත්‍යවශ්‍ය වන අතර නීතියේ ආධිපත්‍ය රට තුළ කඩිනමින් ස්ථාපිත කළ යුතුය. රාජ්‍ය මෙහෙයුම්වල දී දේශපාලන අතපෙවීම් නතර කළ යුතු බව ද අවධාරණය කර සිටිමු.

03 **සම්පූර්ණයෙන් කම්කරු පන්තියට අයිතිව පවතින සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සුරක්ෂිත කළ යුතු බවට යෝජනාකර සිටිමු.**

රුපියල් ට්‍රිලියන 2 ඉක්මවන ඉහත අරමුදල් දෙකෙහිම ආයෝජනයන් පිළිබඳ සහ ආයෝජනයන්හි ප්‍රතිලාභයන් පිළිබඳ සවිස්තර වාර්තාවක් සේවක අර්ථසාධක අරමුදලේ මෙන්ම සේවක භාරකාර අරමුදලේ සාමාජිකයින් වෙත ලබාදීමට අදාළ ගිණුම්වල භාරකාරයා වන කම්කරු කොමසාරිස් ජනරාල්වරයා කටයුතු කළ යුතුය. එම අරමුදල් ආයෝජනය කරමින් උපයන මුදලෙන් රජය අයකරගනු ලබන බදු සියල්ල අහෝසි කළ යුතුය.

04 **රජයේ බදුකරණ ප්‍රතිපත්තිය ජනතාවාදී විය යුතු බවට යෝජනාකර සිටිමු.**

2017 මැද භාගයේදී දේශීය ආදායම් බදු පනතේ සිදුකළ වෙනස්කම් වලින් වැඩකරන ජනතාවටත්, පහළ ආදායම් තීරුවේ ජනතාවටත්, බලපානු ලබන අහිතකර කොන්දේසි යලි සංශෝධනය කිරීම සඳහා කොමිසමක් පත්කිරීම සිදුකරන ලෙසත්, එම කොමිසම හරහා ලබාගන්නා ජනතාවාදී සංශෝධන ක්‍රියාත්මක කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කරන ලෙසත් යෝජනාකර සිටිමු.

05 **දැනුම සම්ප්‍රේෂණය කරන අධ්‍යාපන ක්‍රියාවලිය කිසිදු අයුරකින් ලාභ ඉපැයීම තේමාකර ගනිමින් මුදලට විකිණීම නොකළ යුතු බවට, බලකර සිටින අතරම, ඒ සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කරන ලෙසට ද යෝජනා කර සිටිමු.**

06 පරිසර අධ්‍යයනයන්, ආර්ථික අධ්‍යයනයන් නොකරමින් විදේශයෙන් ලැබෙන මුදලට පමණක් ගිජුව සමාජීය ජීවිතය සහ ජන ජීවිතයත් , මානව පැවැත්මත් අභියෝගයකට ලක්කරන සංවර්ධන ව්‍යාපෘති ඉදිරියේ දී දියත් කිරීම වැලැක්වීම සඳහා සුදුසු නියාමනයන් ඇතිකළ යුතු බවට යෝජනා කරමු.

07 සූර්ය බලශක්ති ණය යෝජනා ක්‍රම සඳහා අය කෙරෙන පොළිය සම්පූර්ණයෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලෙසට යෝජනාකර සිටිමු.

08 කොළඹ නගරයට දිනපතා පැමිණෙන වාහන සංඛ්‍යාව අවම කිරීමට රජයේ පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ වායුසමනය කරන ලද විශේෂිත රාජකාරී දුම්රිය සේවා හා බස්රථ සේවාවන් ආරම්භ කිරීමට පියවර ගැනීම හා දැරිය හැකි මාසික ගාස්තුවකට යටත්ව විශේෂ වරප්‍රසාද කාඩ්පතක් නිකුත් කිරීමට කටයුතු කිරීම මගින් එම ප්‍රවාහන සේවාවන් භාවිතයට ගැනීම පිණිස රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින් උනන්දු කරවීම සිදුකළ යුතුය. සෑම බස්නැවතුම් පොලවල් හා දුම්රිය ස්ථාන ආශ්‍රිතව පෞද්ගලික වාහන නතර කිරීමේ රථගාලක් (Park and Go) පවත්වාගෙන යාමට කටයුතු කිරීම පිණිස මූලික අදියරේ සැළැස්මක් සකස් කළ යුතු බවට යෝජනාකර සිටිමු.

09 අත්‍යවශ්‍ය ආහාර, බෙහෙත්, ළදරු කිරිපිටි සඳහාවන ආනයන බදු දේශීය නිෂ්පාදනවලට අහිතකර බලපෑමක් නොවන පරිද්දෙන් කාලානුරූපීව සංශෝධනය කිරීමට පියවර ගත යුතු බවට යෝජනා කරමු.

10 සෞඛ්‍ය ක්ෂේත්‍රය සහ අධ්‍යාපන ක්ෂේත්‍රය වැනි ප්‍රධානතම සේවාවන්ට අදාළ ***වැට් බද්ද සම්පූර්ණයෙන්ම ඉවත්කිරීමට යෝජනාකර සිටිමු***.

11 **ත්‍රස්තවාදය මුලින් උපුටා දැමීම වෙනුවට රාජ්‍ය ත්‍රස්තවාදය වැපිරීමට ගෙන ආ ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත වහා අහෝසි කළ යුතුය.** වැඩ කරන පන්තියේ ජනතාවට අහිතකර මෙවැනි අණපනත් හා ක්‍රියාකාරකම් වහා නැවැත්විය යුතු අතර, ශ්‍රී ලාංකික පුරවැසියා සතු ප්‍රජාතන්ත්‍රවාදී නිදහස සුරක්ෂිත කිරීමට රජය පියවර ගත යුතු බවට යෝජනාකර සිටිමු.

12 **දේශීය ව්‍යාපාරිකයා හා දේශීය පාරිභෝගිකයා ආරක්ෂා කිරීම උදෙසා ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම්වලට එළඹීමට පෙර රට තුළ ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් සකස් කළ යුතු බවට යෝජනාකර සිටිමු.**

අන්තර්ජාතික වෙළඳ ගිවිසුම්වලට එළැඹීමට පෙර රටතුළ ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් සකස්කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් වන අතර, සාධනීය ප්‍රතිඵල නොලැබෙන, රටට අහිතකර වූ සියලු වෙළඳ ගිවිසුම් වහා අහෝසි කිරීමට පියවර ගන්නා ලෙස යෝජනාකර සිටිමු.

බැංකු සේවකයා සතු වෘත්තීය අභිමානය රැකගැනීමට මෙන්ම රටේ අනාගතය යහපත් දිශාවකට යොමු කිරීමේ යහපත් අරමුණින් ඉහත යෝජනා සංගමය විසින් ජනාධිපති අපේක්ෂකයින් වෙත යොමුකර ඇත. ඊට යහපත් ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන දේශපාලන පක්ෂ නියෝජනය කරන ජනාධිපති අපේක්ෂකයින් විසින් තමන් ඉදිරිපත්කර ඇති ප්‍රතිපත්ති ප්‍රකාශනයන්හි මෙම යෝජනා සිය අනාගත දේශපාලන අභිමතාර්ථයන් ලෙස ඉදිරිපත් කර තිබීම අගය කළ යුතුය. **කුමන ආණ්ඩුවක් බලයට පැමිණිය ද එම අනාගත අරමුණු යථාර්ථයක් වනතුරු අපගේ අරගලය සර්වකාලීන වනු ඇත. එය බැංකු සේවකයින් ලෙසත් රටේ පුරවැසියන් ලෙසත් අපසැම ලබන පොදු ජයග්‍රහණයක් වන බැවින් ලංකා බැංකු සේවක සංගමයේ නියත අභිමානය වන සාමාජික ඔබ, සංගමය නිරතුරුවම ශක්තිමත් කරමින් රටේ බැංකු පද්ධතිය හා අනාගතය රැක ගැනීමට සංගමයේ ධජය වටා එකාවන්ව පෙළගැසිය යුතු බව සිහිපත් කර සිටිමු.**

## මේ අපේ ජය භූමියයි !

## ලංකා බැංකු සේවක සංගමය දිගුකල් දිනේවා !

මෙයට - සහෝදරත්වයෙන්

***චන්න දිසානායක***
සභාපති

***රන්ජන් සේනානායක***
ප්‍රධාන ලේකම්

2019 නොවැම්බර් මස 05 වන දින